**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ප්‍රකාශ කරමි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සිගාස් වැඩසටහනේ මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව හා භාණ්ඩාගාර 82 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම් 12 ක එකතුව රු.192,042,786 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඒකාබද්ධ වාර්තාව නිවැරදි කර ගැනීමට අවශ්‍ය තොරතුරු භාණ්ඩාගාරයේ සිගාස් අංශය වෙත ලබා දී ඇති අතර 2023.12.31 දිනට පෙර නිවැරදි කරමි. | සිගාස් වැඩසටහන හා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වටිනාකම එකිනෙකට සැසඳිය යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.12,897,890 ක් වූ නමුත්, ගිණුම සමඟ ඉදිරිපත් කළ ඒසීඒ - 06 ආකෘතිය අනුව රු.128,968,940 ක් වූයෙන් රු.116,071,050 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රමාද දෝෂයකින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපල පිරියත හා උපකරණ අඩුවෙන් සටහන් කර ඇති අතර නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශේෂ සැසඳිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | වත්කම් විචලන ලේඛනය අනුව අපහරණය කරන ලද වත්කම්වල හා අළුතින් එකතුකළ වත්කම්වල වටිනාකම පිළිවෙලින් රු.9,139,125 ක් හා රු.460,199,179 ක් විය. සිගාස් වත්කම් ලේඛනය අනුව එම අගයන් පිළිවෙලින් රු.9,836,490 ක් හා රු.518,033,053 ක් වූයෙන් පිළිවෙලින් රු.697,365 ක හා රු.57,833,874 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2023.12.31 දිනට පෙර නිවැරදි කර වාර්තා කරමි. | අපහරණය කරන වත්කම්වල හා අළුතින් එකතු කළ වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශවල පෙන්විය යුතුය. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 57 ක් සඳහා 2022 ජූලි 06 දින රු.845,109 ක වියදමක් දරා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබු නමුත් රක්ෂණ ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරි වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට සටහන් කර ඇති බව වාර්තා කරමි. | රක්ෂණ ගිවිසුම ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාල චක්‍රලේඛයේ iv ඡේදය** | ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සේවය කළ කාලය සනාථ කර නොගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක නිලධාරීන් 09 දෙනෙකු | හක්මණ, පිටබැද්දර හා පස්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල නිලධාරීන් නිවාඩු දින වැටුප් ලබා ගැනීමේදී | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව ගෙවූ නිවාඩු |

| | | |
|---|---|---|
| වෙත 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා එකතුව රු.629,139 ක් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගන්නා බව වාර්තා කරමි. | දින වැටුප් ආපසු අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ගෘහ ආර්ථික හා පෝෂණය වැඩිදියුණු කර, පවුල් ඒකක සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ රු.459,000 ක් වැයකර ප්‍රතිලාභීන් 102 දෙනෙකුට කිකිළි පැටවුන් 10 බැගින් බෙදාදී තිබුණි. කිකිළි පැටවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බලා කටයුතු නොකිරීම හා ව්‍යාපෘතිය සම්බන්ධ පසු විපරම් නොකිරීම නිසා කිකිළි පැටවුන් මියයාම මත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී දරන ලද වියදම නිශ්ඵල වී තිබුණි. | කිකිළි පැටවුන්ට වෛරස් රෝගය සෑදීම හා සතුන්ගෙන් හානි සිදු වීම නිසා සම්පූර්ණ කිකිළි පැටවු ප්‍රමාණය ප්‍රතිලාභීන් සතුව නොසිටි බව වාර්තා කරමි. | ව්‍යාපෘති නිසි අධ්‍යයනයෙන් පසු ආරම්භ කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භ කළ පසු නිසි ලෙස පසු විපරම් කිරීම සිදු කළ යුතුය. |
| (ආ) | ජාතික කෘෂි ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ හක්මණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වසම් 34 ක තෝරාගත් එළවළු වර්ගයන්ගෙන් එක් බඳුනක් බැගින් ඇසුරුම් කර ලබාදීම වෙනුවෙන් තවාන්කරුවන් 30 දෙනෙකුට රු.862,470 ක් ගෙවා තිබුණි. නිසි සැලැස්මක් හා පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම මත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී තිබුණි. | කොවිඩ් තත්ත්වය හා ආර්ථික අර්බුදය හමුවේ පැල තවාන් අසාර්ථක වූ නමුත් වරින් වර මේ සම්බන්ධව නිරීක්ෂණය කර නැවත පැල තවාන් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා උපදෙස් ලබා දී ඇති බව වාර්තා කරමි. | ව්‍යාපෘති නිසි අධ්‍යයනයෙන් පසු ආරම්භ කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භ කළ පසු නිසි ලෙස පසු විපරම් කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමෘද්ධි පවුල් ලක්ෂ 2 ක් කේන්ද්‍ර කරගත් අංගසම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 198 දෙනෙකු වෙත ව්‍යාපාරික උපකරණ, කුරුඳු පැල හා තේ පැල ලබාදී තිබුණි. 2022 නොවැම්බර් 24 දින භෞතික පරීක්ෂාවේදී කුරුඳු පැල ලබාගත් ප්‍රතිලාභීන් වගාව නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. සමෘද්ධි වසම් 2 ක ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ලබාදී තිබූ තුනපහ ඇඹරීමේ යන්ත්‍ර 02 ක් භාවිතයට ගෙන නොතිබුණි. නිසි විශ්ලේෂණයකින් තොරව ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | ජයවික්‍රමපුර කලාපයේ බෙරලැලිය වසමේ කුරුඳු පැල ලබාගත් ප්‍රතිලාභීන් දැනුවත් කර නිසි පරිදි කුරුඳු පැල පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇති බවත්<br>තුනපහ ඇඹරීමේ මැෂින් 2 ට අදාළ ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමට නොහැකි වූයේ කොවිඩ් වසංගත තත්ත්වය හා රටේ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් බවත් වාර්තා කරමි. | ව්‍යාපෘති නිසි අධ්‍යයනයෙන් පසු ආරම්භ කිරීමට පියවර ගතයුතුය. |
| (ඈ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම නිලධාරී වසම් 2 ක් ආවරණය වන පරිදි රු.586,000 ක් වැයකර ප්‍රතිලාභීන් 27 දෙනෙකුට ලබාදී තිබුණු කුකුල් පැටවුන් 1465 ක් මියයාම නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | රටේ පවතින ආර්ථික අර්බුදයත් සමග මුදල් නොමැති බැවින් කිකිළි පැටවුන්ට ආහාර සපයාදීම මගින් ඔවුන්ගේ ආර්ථිකයට අමතර වැය බරක් දැරීමට සිදුවී ඇති බව වාර්තා කරමි. | නිසි අධ්‍යයනයකින් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කිරීමට පියවර ගතයුතුය. |
| (ඉ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසමක ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා රු.301,423 ක රජයේ දායකත්වය යටතේ ලබාදුන් පළතුරු පැල සතුන් විසින් හානි කර තිබුණි. ප්‍රතිලාභීන්ට ලබාදුන් ජල මෝටර් 02, තාච්චි 05, වීල්බැරෝ 04, උදළු තල 03, අලවංගු, මල්බාල්දි, ජලනල හා ජල ටැංකි යන උපකරණ නිශ්ක්‍රීයව | ප්‍රතිලාභීන් විසින් ලබාගත් පැළ වන සත්ත්ව හානි හා ගස්ලබු වලට වැළඳුන ලෙඩ රෝග හේතුවෙන් වගාවන් විනාශ වීම, ලබාදුන් උපකරණ ඌණ උපයෝජිතව පවතින අතර බුලත් හා ඇන්තූරියම් මල් නිෂ්පාදන ව්‍යාපෘතියෙන් කොවිඩ් වසංගතය හා ආර්ථිකයේ ඇතිවූ අර්බුදකාරී ස්වභාවය නිසා පසුබෑමකට ලක්වී ඇති බව,රසකැවිලි නිෂ්පාදන ව්‍යාපෘතිය රටේ ආර්ථික | ව්‍යාපෘති පිළිබඳව අධ්‍යයනයක් සිදුකර ආරම්භ කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භ කළ පසු නිසි ලෙස පසු විපරම් කිරීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිවෙස්වල තිබුණි. ග්‍රාම නිලධාරී වසමක බුලත්, අන්නාසි, රසකැවිලි නිෂ්පාදනය සඳහා ප්‍රතිලාභීන් 72 දෙදෙනෙකු වෙනුවෙන් රු.12,018,299 ක් වැයකර තිබුණද වගාවන් විනාශ වීම සහ නිෂ්පාදන අලෙවිකර ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපෘති අසාර්ථක වී තිබුණු අතර මෙම ව්‍යාපෘති පිළිබඳව ආර්ථික සංවර්ධන නිලධාරීගේ පසුවිපරම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | තත්ත්වය නිසා යම් ප්‍රමාදයක් වන බවක් දක්නට ලැබෙන බව හා බතික් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා පුහුණු වැඩසටහන් පමණක් පැවැත්වූ බව වාර්තා කරමි. | |
| (උ) | 2016 - 2021 අතර කාලය තුළ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් හා ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙන් පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලද ප්‍රතිපාදන රු.9,149,964 ක් වැය කරමින් අත්පන්දු ක්‍රීඩාංගන 04 ක් ඉදිකර තිබුණ ද එම ක්‍රීඩාංගනවලින් රු.6,823,091 ක් වැයකර ඉදිකරන ලද ක්‍රීඩාංගන 03 ක් විගණන දිනය වූ 2023 ජනවාරි 25 දින වනවිට ද භාවිතයට නොගන්නා බව නිරීක්ෂණය විය. | ක්‍රීඩා අමාත්‍යාංශයෙන් හා ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන මත ඉදිකරන ලද මෙම ක්‍රීඩාංගන වර්තමානයේ ප්‍රයෝජනයට නොගැනීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් හා ප්‍රාදේශීය සභාව දැනුවත් කර ඇති බව වාර්තා කරමි. | රජයේ ප්‍රතිපාදන සැලසුම් සහගතව වඩා ඵලදායී කරුණට පමණක් වියදම් කළ යුතුය. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් 49 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් රු.1,251,121 ක් ගෙවා තිබුණ ද ක්ෂේත්‍ර වලදී ඉටුකළ රාජකාරිය සම්බන්ධ විධිමත් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | ක්ෂේත්‍ර නිලධාරීන් කොට්ඨාස දිනයේදී පසුගිය මාසය තුළ ඉටු කරන ලද විශේෂ වැඩසටහන් සම්බන්ධ ප්‍රගතිය ඉදිරිපත් කරනු ලබන බවත්, දෛනිකව නිලධාරීන් ක්ෂේත්‍රයේ සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් හා රාජකාරි පිළිබඳව කාර්යාලයේ වට්ස්ඇප් සමූහයට දත්ත හා පින්තූර යොමු කරන බව වාර්තා කරමි. | විධිමත් පරිදි වාර්තා නඩත්තු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 කින් තොරතුරු කැඳවන ලදි. 2023 මාර්තු 24 දින වනවිට විගණනයට තොරතුරු ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ට අදාළව ලියාපදිංචි කරන ලද ග්‍රාම ශක්ති ජනතා සමිති 146 න් 2022 දෙසැම්බර් 31 දින වනවිට ජනතා සමිති 99 ක් අක්‍රීය මට්ටමේ පැවතුණි. එම සමිතිවල රු.36,293,148 ක තැන්පතු ද ක්‍රියාකාරී මට්ටමේ පවතින සමිති 47 ක තැන්පතු ලෙස රු.23,906,661 ක් ද ඇතුළුව එකතුව රු.60,199,809 ක ශේෂයක් රාජ්‍ය බැංකුවල තැන්පත් කර තිබුණු අතර ව්‍යාපෘති ක්‍රියාකාරකම් නවතා දැමීම නිසා එම මුදල් නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | සක්‍රීය මට්ටමේ නොපවතින ග්‍රාමශක්ති ජනතා සමිති ගිණුම්වල පවතින මුදල් නැවත පවරා ගන්නා ලෙස ද සෞභාග්‍යා කාර්යාංශය වෙත දන්වා ඇති බව වාර්තා කරමි. | අක්‍රිය සමිතිවල ඇති මුදල් කඩිනමින් පවරා ගැනීමට පියවර ගතයුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තෘතීයික මට්ටමේ තනතුරක එක් නිලධාරියෙක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්විතීයික මට්ටමේ තනතුරුවල සේවකයින් 460 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරක එක් නිලධාරියෙක්ද වශයෙන් මුළු අතිරික්ත නිලධාරීන් 462 දෙනෙකු විධිමත් පරිදි අනුමත කර ගැනීමෙන් තොරව සේවයේ නියුක්ත කර තිබුණි. | අතිරික්තය සිදුව ඇත්තේ උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම හේතුවෙනි. ඉදිරියේ දි ඒ සඳහා ක්‍රියා මාර්ග අමාත්‍යාංශ මට්ටමින් ගනු ඇති බව වාර්තා කරමි. | අතිරික්තය තුලනය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ජාතික අයවැය චක්‍ර ලේඛ අංක 1/2023 මගින් වියදම් කළමනාකරණය කර ඇති බැවින් මානව සම්පත් සංවර්ධනය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම සීමා කර ඇත. ඒ සඳහා ගිවිසුම් අත්සන් කර නොමැති බව වාර්තා කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |